# මාසික
# විවරණිකාව

2012 ජනවාරි



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

62 වැනි වෙළුම 01 වැනි කලාපය

**2012 ජනවාරි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් - 2012 ජනවාරි | .... | 05 - 06 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2012 ජනවාරි | .... | 07 |
| 1. උද්ධමනය 2011 වසරේදී ද අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමෙහි පැවතිණි | .... | 07 - 09 |
| 2. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 ජනවාරි | .... | 09 - 10 |
| 3. 2011 නොවැම්බර් මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය | .... | 10 - 13 |
| 4. 2012 ජනවාරි මස උද්ධමනය පහළ වැටේ | .... | 14 |
| 5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) | .... | 15 |

# 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2012 ජනවාරි

**රාජ්‍ය මූල්‍ය අංශය**

- පහත සඳහන් ආනයන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

  - ශබ්ද විකාශන යන්ත්‍ර හා ඇම්ලිෆයර්ස්, ශ්‍රව්‍ය සංඛ්‍යාත විද්‍යුත් වර්ධක හා උපාංග, සිනමා මාධ්‍ය උපකරණ, ඩිජිටල් භාවිතා කරන කියවීමේ උපකරණ ආදිය

  - හරිතාගාර, පොලි ටනල්ස් සහ හරිතාගාර ඉදිකිරීම සඳහා හා පොලි ටනල්ස් නිෂ්පාදනය සඳහා වගාකරුවනට අවශ්‍ය වන ද්‍රව්‍ය

  - ලොරි, ට්‍රක් රථ, බස් රථ, ක්‍රීඩා උපකරණ, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ, ඉරු දැව, අච්කණ්නාඩි, සුවඳ විලවුන්, උදළු, මුල්ලු සහ අච්චු (ලෝහ, වීදුරු, රබර්, ප්ලාස්ටික්), කුකුළු කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ සහ උපාංග, ආලෝක සංවේදී අර්ධ සන්නායක උපකරණ සහ ඇස් කණ්නාඩි හා ඇස් කණ්නාඩි රාමු නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය හෝ සැපයුම්

- අහස් යානා, නැව්, කෘතිම පාද, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවන ආධාරක, එම ආධාරක සඳහා වන අමතර කොටස්, දෘශ්‍යාබාධිතයින් සඳහා සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන සහ කොටස්, බ්‍රේල් ලියන පත්‍රිකා සහ පුවරු දැව කඳන්, මහන නූල් හා එළවළු කෙඳි ආශ්‍රිත නූල් හැර අනෙකුත් නූල් සහ රෙදිපිළි ආදිය ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- සීනි, පියළි නොකළ මයිසූර් පරිප්පු, පියළි කළ මයිසූර් පරිප්පු සහ සුදු ඇනු ආදි තෝරාගත් අයිතමයන් කිහිපයක් ආනයනය සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හතකර කාලයක් සඳහා වැඩි කරන ලදී.

- අලුත් හෝ ශීතකල මසුන් සහ හිමායිත මසුන්, සෝයා බෝංචි තෙල් ඇතුළු පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ පොල් තෙල් ආදී අයිතමයන් ආනයනය සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අළුතින් හඳුන්වා දෙන ලදී.

- පෙට්‍රල් සහ ඩීසල් ආනයනයේ දී ලබා තිබූ සම්පූර්ණ තීරු බද්ද අත්හැරීම පිළිවෙලින් ලීටරයකට රුපියල් 35 සිට ලීටරයකට රුපියල් 23 දක්වා හා ලීටරයකට රුපියල් 15 සිට ලීටරයකට රුපියල් 13 දක්වා අඩු කරන ලදී.

- පහත දැක්වෙන අයිතමයන් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

  - ජල විදුලි බල උත්පාදනය සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, සංචාරක හෝටල් සහ ගුවන් සේවා සඳහා අවශ්‍ය වන දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදිත භාණ්ඩ, ටින් මාළු, ටර්බයින, හඳුනාගත් රාජ්‍ය ආයතනයන්ට අවශ්‍ය ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවට ආදේශනය කරනු ලබන දේශීයව නිෂ්පාදිත භාණ්ඩ සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන

  - පර්යේෂණ හා සංවර්ධන සේවා, වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් සහ චිත්‍ර ශිල්පීන් විසින් ඔවුන්ගේ චිත්‍ර නිර්මාණ සැපයීම

- ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල් සඳහා පොලී, ලාභාංශ හෝ ණය උපකරණ මගින් ලැබෙන ලැබීම්

- අපනයනකරුවන් සඳහා භාණ්ඩ තොග සහ සිල්ලරට විකිණීම, නැවුම් කිරි, අමු තේ දළු, කුරුඳු, රබර් (ලේටෙක්ස්, ක්‍රේප් හෝ ෂීට් රබර්), පිරවුම්හලක විකුණන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්, දේශීයව නිෂ්පාදනය කළ මැටි, උළු කැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන එම නිෂ්පාදකයා විසින් විකිණීම, චිත්‍ර නිර්මාණකරුවෙකු විසින් තම චිත්‍ර විකිණීම ආදිය ජාතිය

**ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් ලද ණය**

ගැටුම් පැවති ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ ව්‍යාපෘතියෙහි දෙවන හා තෙවන අතිරේක අරමුදල් සම්පාදනය මූල්‍යනය කිරීම සඳහා 2011 නොවැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය අතර, වි.ගැ.හි.මිලියන 30.3 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 5.4 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් සහ වාර්ෂිකව සියයට 0.75 ක සේවා ගාස්තුවක් ද අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**ඉන්දියානු අපනයන - ආනයන බැංකුවෙන් ලද ණය**

2011 ජනවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු අපනයන - ආනයන බැංකුව අතර, ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී. ඊට අදාළ තොරතුරු පහත පරිදි වේ.

**1. එ.ජ.ඩොලර් මිලියන 60.7 ක් සඳහා වූ ණය මුදල**

දඹුල්ල ජල සැපයුම ව්‍යාපෘතියෙහි පළමු අදියර මූල්‍යනය කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 60.69 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6.9 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. ණය මුදල සඳහා හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය මත සියයට 2 ක වාර්ෂික පොලී අනුපාතියක් ද, වාර්ෂිකව සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද, වාර්ෂිකව සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක්ද අදාළ වේ. වසර 3 ක සහන කාලයකට යටත්ව වසර 14 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**2. එ.ජ.ඩොලර් මිලියන 328.37 ක ණය මුදල**

උතුරු පළාතේ දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනයකිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 382.37 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 37.4 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. ණය මුදල සඳහා හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය මත සියයට 0.5 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ද, වාර්ෂිකව සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද වාර්ෂිකව සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**3. ලෝක බැංකුවෙන් ලද ප්‍රදාන**

සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 දෙසැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව අතර, ඉන්දියානු රුපියල් බිලියන 13.2 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 28.5 ක) ප්‍රදානයන් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- ලබාගන්නා ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර ක්‍රියාකරු විදුලි සංදේශ බද්ද මිනිත්තුවකට රුපියල් 2 සිට රුපියල් 3 දක්වා ඉහළ දමන ලදී.

- ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර ක්‍රියාකරු විදුලි සංදේශ බද්ද මිනිත්තුවකට ඇමරිකානු ඩොලර් 0.07 සිට ඇමරිකානු ඩොලර් 0.09 දක්වා ඉහළ දැමීම.


**2 වන කොටස**

# පුවත්පත් නිවේදන

**2012 ජනවාරි**

## 1. උද්ධමනය 2011 වසරේදී ද අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමෙහි පැවතිණි.

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/07 = 100) මගින් මනිනු ලබන ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය 2011 ජනවාරි මස පැවති සියයට 6.2 හි සිට 2011 දෙසැම්බර් මාසයේදී සියයට 4.9 දක්වා පහළ වැටුණු අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය අනුපාතිකය 2011 දෙසැම්බර් මාසයේ දී සියයට 6.7 ක අගයක් වාර්තා කරමින් වසර මුල පුරෝකථනය කළ පරිදි උද්ධමනය මැදි තනි ඉලක්කමක මට්ටමෙහි ස්ථාවරව පැවතිණි.*




කො.පා.මි.දර්ශකයේ භාණ්ඩ පැසෙන් නැවුම් ආහාර, බලශක්ති, ප්‍රවාහන, සහල් සහ පොල් යන අයිතමයන් ඉවත් කිරීමෙන් පසු ගණනය කරනු ලබන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත පහළ බසිමින් දෙසැම්බර් මාසයේ දී සියයට 4.7 දක්වා ළඟා විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය වර්ෂය අවසානයේදී සියයට 6.9 ක් විය.

### 2011 වසරේ මිල විචලනයන්

සියයට 6.7 ක් වූ දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය ඉහළයාම කෙරෙහි ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ (සියයට 8.8) මිල ගණන් ඉහළයාම ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 4.3); ප්‍රවාහන (සියයට 7.1); රෙදිපිළි හා පාවහන් (සියයට 13.4); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 4.6); සෞඛ්‍ය (සියයට 2.7); අධ්‍යාපන (සියයට 3.5); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 3.9); සහ සංස්කෘතික හා විනෝදාත්මක කටයුතු (සියයට 5.5); යන උප කාණ්ඩවල සාමාන්‍ය මිල ගණන්ද පසුගිය වසර සමඟ සැසඳීමේ දී ඉහළ නැගිණි. කෙසේ වුවද, සන්නිවේදන උප කාණ්ඩයේ මිල ගණන් වර්ෂය තුළදී නොවෙනස්ව පැවතිණි.

ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පැවති ගංවතුර තත්ත්වය හේතුවෙන් ඇති වූ වගා හානි මෙන්ම ප්‍රවාහන දුෂ්කරතාවන්හි ප්‍රතිඵලයක් ලෙස වසරේ මුල් මාස තුන තුළ දී දේශීයව නිෂ්පාදිත කෘෂි හා අනෙකුත් ආහාර වර්ගවල විශේෂයෙන්ම

එළවළුවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැගිණි. මෙම තත්ත්වය තාවකාලික වුවද, ලක්ෂ්‍යමය උද්ධමනය, අප්‍රේල් මාසයේදී උපරිම අගයට ළඟා වන තෙක් ඉහළ නැගුණු අතර අනතුරුව සැපයුම් සාධකවල වර්ධනයන් හේතුවෙන් පහළ වැටිණි. ජාත්‍යන්තර වෙළෙඳපොළේ තිරිඟු පිටි සහ කිරිපිටි වැනි ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම ආහාර උප දර්ශකය ඉහළ නැංවීමටත්, ඒ අනුව කො.පා.මි.දර්ශකය ඉහළ නැංවීමටත් හේතු විය. තවද, අදාළ කාලපරිච්ඡේදයේදී ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්, එල්පී ගෑස් සහ බස් ගාස්තුවල මිල ඉහළ නංවමින් කළ සංශෝධන ද උද්ධමන සඳහා ඍජු හා වක්‍ර යන දෙයාකාරයෙන්ම දායක විය.

මහ කන්නයේ නිෂ්පාදනයෙහි තියුණු පහළ යාමක් සිදු වුවද, 2010 සමග සැසඳීමේ දී 2011 වසරේ සහල්වල සාමාන්‍ය මිල ගණන් පහළ මට්ටමක පැවතිණි. 2011 පෙබරවාරි සහ මාර්තු මාසවලදී සියලුම වර්ගවල පාහේ සහල්වල සුළු මිල ඉහළයාමක් වාර්තා වුවද, ඉතා සරු යල අස්වැන්නත් සමග වෙළෙඳපොළෙහි ප්‍රමාණවත් තොග පැවතීම නිසා ඉන්පසු මිල පහළයාම ඇරඹිණි. කෙසේ වුවද, 2011 ඔක්තෝබර් මාසයේ සිට සහල් මිලෙහි ක්‍රමිකව ඉහළයාමක් දැකිය හැකි විය.

2010 සමඟ සසඳන විට 2011 වසරේ දී එළවළුවල බර තැබූ සාමාන්‍ය මිල සියයට 7.4 කින් ඉහළ නැගිණි. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පැවති අධික වර්ෂාපතනය සහ ගංවතුර හේතුවෙන් හටගත් සැපයුම් හිඟතාවයන් නිසා උඩරට, පහතරට දෙවර්ගයේම බොහෝ එළවළු වර්ගවල සහ පලා වර්ගවල සැලකිය යුතු මිල ඉහළ යාම් 2011 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළ වාර්තා විය. කෙසේ වුවද, ඍතුමය සාධකවල බලපෑමෙන් නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී එළවළු මිලෙහි ඉහළයාමක් දක්නට ලැබුණද සැපයුම් තත්ත්වයන්හි සිදුවූ වර්ධනයන් නිසා අප්‍රේල් මාසයේ සිට එළවළු මිල ගණන් විශාල ලෙස පහළ වැටුණි.

පොල් සහ පොල් තෙල් මිල ගණන් වසරේ මුල් සිව් මස තුළ ඉහළ අගයන්හි පැවතියද මැයි මාසයේ සිට එහි පහළ බසින නැඹුරුවක් දක්නට ලැබුණු අතර, නොවැම්බර් මාසයේ දී පහළම අගයන් වාර්තා විය. 2011 ජනවාරි මාසය සමග සැසඳීමේ දී, දෙසැම්බර් මාසයේ දී පොල් සහ පොල් තෙල් යන දෙවර්ගයෙහිම මිල ගණන් පිළිවෙළින් සියයට 29.2 කින් හා සියයට 28.7 කින් පහළ වැටිණි.

අනෙකුත් දේශීයව නිෂ්පාදිත ආහාර වර්ග අතුරින්, රතු ළූණු සහ අර්තාපල්වල සාමාන්‍ය මිල පූර්ව වර්ෂයට සාපේක්ෂව 2011 වසරේ දී පිළිවෙළින් සියයට 61.9 සහ සියයට 10.5 කින් ඉහළ නැගුණු අතර, ලොකු ළූණුවල සාමාන්‍ය මිල සියයට 5.9 කින් පහළ වැටිණි. අහිතකර කාලගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස සැපයුම පහළයාම නිසා 2011 වසරේ මුල් මාස දෙක තුළ රතු ළූණුවල ඉහළ මිල ගණන් පැවතීම, වසර තුළ රතු ළූණුවල සාමාන්‍ය මිල සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ළූණු මිල ගණන් 2011 ජනවාරි මාසයට සාපේක්ෂව මාර්තු මාසයේ සිට පහළ වැටිණි. අර්තාපල් පිළිබඳව සැලකීමේ දී, සැපයුමෙහි පහළ යාමක් හේතුවෙන් අප්‍රේල් මාසයේ සිට මිල ගණන්වල ඉහළයාමේ නැඹුරුවක් දක්නට ලැබිණි. ඉන්පසු දෙසැම්බර් මාසයේදී රජය මගින් විශේෂිත භාණ්ඩ බද්ද අඩුවන පරිදි සිදුකළ සංශෝධනය අර්තාපල් මිල ස්ථාවර කිරීමට උපකාරී විය.

2010 මුල් මාස දහය සමග සැසඳීමේදී 2011 අදාළ කාලපරිච්ඡේදය තුළ මත්ස්‍ය හා මුහුදු ආහාර නිෂ්පාදනය සියයට 15.5 කින් ඉහළ ගිය ද බර තැබූ සාමාන්‍ය මත්ස්‍ය මිල සියයට 6.0 කින් ඉහළ නැගිණි. 2010 සමග සැසඳීමේ දී 2011 වසරේ සාමාන්‍ය මිල ඉහළ යාම සියයට 5.1 ක් විය. සාමාන්‍ය වශයෙන් ගත් කළ, කුඩා මත්ස්‍ය විශේෂවල මිල ඉහළ යාම පහළ මට්ටමක පැවතිණි. ඉහළ මත්ස්‍ය මිල ගණන් අනුව යමින් 2011 වසරේ දී සියලුම වර්ගවල පාහේ කරවල මිල ගණන් ඉහළ නැගිණි. මේ අතර, 2011 වසරේ දී 2010 ට සාපේක්ෂව බිත්තර මිල ගණන් පහළ මට්ටමක පැවතිණි.

වසර තුළ අවස්ථා කිහිපයක දී ඉන්ධන සහ එල් පී ගෑස්වල මිල ඉහළ නංවමින් සිදු කළ සංශෝධන ද ඍජු හා වක්‍ර යන දෙආකාරයෙන්ම කො.පා.මි. දර්ශකය කෙරෙහි බලපෑවේය. ආනයනික

බොරතෙල් මිලෙහි සිදුවූ උච්චාවචනයන්ට අනුව යමින් ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් මිල ගණන් 2011 වසරේ අවස්ථා කිහිපයකදී සංශෝධනය කෙරිණි. ඒ අනුව, වසර තුළ එම අයිතමයන්ගේ මිල ගණන් සියයට 15.1 කින්, සියයට 19.1 කින් සහ සියයට 39.2 කින් ඉහළ නැගිණි. 2011 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස් ගාස්තු ද සියයට 7.6 කින් ඉහළ නැංවිණි. මේ අතර, කි.ග්‍රෑම් 12.5 ක් බරැති එල්පී ගෑස් සිලින්ඩරයක මිල 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සාමාන්‍ය වශයෙන් සියයට 29.0 කින් ඉහළ නැගිණි. මෙම සෘජු බලපෑමට අමතරව, ඉහත මිල සංශෝධනයන් මගින් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හරහා කො.පා.මි. දර්ශකය මත වක්‍ර බලපෑමක් ඇති විය.

2011 වසරේදී ජාත්‍යන්තර වෙළෙඳපොළේ මිල ඉහළයාම්වලට සමගාමීව සමහර ආහාර වර්ගවල දේශීය මිල ගණන් ඉහළ නැංවිණි. මේ අනුව, 2011 අප්‍රේල් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තිරිඟු පිටි කිලෝ ග්‍රෑමයක මිල රුපියල් 3.00 කින් ඉහළ නැංවීම, 2011 අප්‍රේල් මස 22 වැනි දින සිට ග්‍රෑම් 450 ක් බරැති පාන් ගෙඩියක මිල රුපියල් 2.00 කින් ඉහළ නැංවීමට හේතු විය. මේ අතර, 2011 මැයි මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රෑම් 400 ක් බරැති කිරිපිටි පැකට්ටුවක උපරිම විකුණුම් මිල රුපියල් 20.00 කින් ඉහළ නැංවිණි. මෙය ද සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේදී කො.පා.මි.දර්ශකය ඉහළ නැංවීමට දායක විය.

## 2. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 ජනවාරි

*2011 තුන්වන කාර්තුවේදී දළ දේශීය නිෂ්පාදිතය සියයට 8.4 කින් වර්ධනය වූ අතර කෘෂිකාර්මික, කාර්මික සහ සේවා යන අංශ තුනෙහිම වර්ධනය ඒ සඳහා දායක විය. 2011 දී දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය සියයට 8.3 ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.*

මේ අතර, පසුගිය වසර කිහිපය මුළුල්ලේම ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සිදුවෙමින් පවතින සැලකියයුතු ව්‍යුහාත්මක වෙනස්වීම් තුළින් ඇතිවන ඉහළ වර්ධන ප්‍රවණතාව හේතුවෙන් ගෝලීය ආර්ථික කටයුතුවල පසුබෑම හමුවේ වුව ද, 2012 දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 8 ක පමණ වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂිතය. ආර්ථික සහ සාමාජීය යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා අඛණ්ඩවම සිදුකරනු ලබන දැඩි ප්‍රයත්නයන් මඟින් රටේ ඵලදායිතාව ඉහළ නැංවීමක් අපේක්ෂා කරනු ලබන අතර එමඟින්, රටෙහි වර්ධන විභවතාව වෙත ළඟාවීමට හැකිවනු ඇත. යටිතල පහසුකම්වල වැඩිදියුණුවීම් සැපයුම් අවහිරතා ඉවත්කර ගැනීමට උපකාරී වනු ඇති අතර එමඟින් මිල ගණන් මත ඇතිවන පීඩන අඩු කිරීමට ද හැකිවනු ඇත. "2012 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති පෙර දැක්ම" තුළින් ප්‍රකාශයට පත්කළ පරිදි, 2012 දී උද්ධමනය මැදි-තනි අංකයක මට්ටමේ පවත්වා ගැනීමට අපේක්ෂා කරන අතර පුළුල් මුදල් සැපයුම, 2012 දී සියයට 15 කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.

ආර්ථිකයෙහි සිදුවෙමින් පවත්නා ව්‍යුහාත්මක වෙනස්කම් විදේශීය අංශය තුළින් ද පිළිබිඹු වනු ඇත අතර, සංචාරක ඉපැයුම් එ.ජ.ඩොලර් බිලියන 1.2 දක්වා ද, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් බිලියන 6.5 දක්වා ද, සෘජු විදේශ ආයෝජන එ.ජ.ඩොලර් බිලියන 2.0 දක්වා ද ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, 2012 දී පෞද්ගලික අංශය වෙත වන ණය ප්‍රාග්ධන ලැබීම් ද සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය මූල්‍ය අංශයේ මූලික ඇස්තමේන්තුවලට අනුව 2011 සඳහා වන අයවැය හිඟය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 7 ක් වූ සංශෝධිත ඉලක්කගත මට්ටම තුළ පවත්වා ගැනීමට රජයට හැකිවී ඇත. 2012 දී අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.2 ක් දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කරනු ලබන අතර එමඟින් පෞද්ගලික අංශය වෙතැති සම්පත් ප්‍රමාණය තවදුරටත් වර්ධනය වනු ඇත.

මුදල් අංශයේ වර්ධනයන් පිළිබඳව සලකා බැලීමේදී, පෞද්ගලික අංශය ලබාගත් ණය

ප්‍රමාණය 2011 වසර මුළුල්ලේම ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර, නොවැම්බර් මාසය වන විට, එහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 33.5 ක් ලෙස වාර්තා විය. ප්‍රධාන වශයෙන්ම ණය ලබාදීමේ ශීඝ්‍ර වර්ධනය පිළිබිඹු කරමින්, 2011 වසරේදී පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය ද අපේක්ෂිත මට්ටමට වඩා ඉහළින් පැවතුණි. නොවැම්බර් මාසය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය සියයට 20.6 ක් විය. කෙසේ වෙතත්, දේශීය මුදල් වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතා තත්ත්වයෙහි සිදුවන වෙනස්වීම් අනුව මෑත මාසවලදී වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2011 දී වසරක කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතිකය පදනම් අංක 175 කින් පමණ ඉහළ ගිය අතර, බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) පදනම් අංක 100 ක පමණ ඉහළ යාමක් වාර්තා කළේය. මේ මේ අතර, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWDR) 2011 දී පදනම් අංක 120 කින් පමණ ඉහළ ගියද, වෙළෙඳපොළ තත්ත්වය යම්දුරකට ස්ථායීවීමක් පෙන්නුම් කරමින්, පසුගිය වෙන්දේසියේදී ප්‍රාථමික වෙළෙඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් මත වූ බරිත සාමාන්‍ය ඵලදාව නොවෙනස්ව පැවතුණි. පොලී අනුපාතිකයන්හි මෙම මධ්‍යස්ත ඉහළයාම හේතුවෙන් මුදල් සමස්තයන්හි වර්ධනය සීමා වනු ඇති අතර එමඟින්, ඉල්ලුම් පීඩන ගොඩනැගීම ද වැළැක්වෙනු ඇත.

ඉහත වර්ධනයන් සැලකිල්ලට ගැනීමෙන් පසුව දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි වෙනසක් කිරීම අවශ්‍ය නොවන බව මුදල් මණ්ඩලයේ තීරණය වූ අතර, 2012 ජනවාරි 10 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික එහි වර්තමාන මට්ටමේම නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව, ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 7.00 ක් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 ක් ලෙස පවතිනු ඇත.

මීළඟ මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2012 පෙබරවාරි මස 9 වැනි දින නිකුත් කිරීමට නියමිතය.


## 3. 2011 නොවැම්බර් මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය

*පෙර ගැටුම්කාරී තත්ත්වයන් පැවති ප්‍රදේශයන් ද ඇතුළත්ව ආර්ථිකයේ ඇති වූ ව්‍යුහාත්මක වෙනස්වීම් සමග පුළුල් වශයෙන් සිදු වූ ආර්ථික වර්ධනය, විදේශීය වෙළෙඳාම තවදුරටත් පුළුල්වීම සඳහා හේතු විය. එසේම, ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගෙන යාම සහ ඊට සහාය වීම සඳහා හඳුනාගත් විදේශ විනිමය ගලා ඒම් ද විදේශ වෙළෙඳාම පුළුල් වීම සඳහා දායක විය.*


2010 නොවැම්බර් මාසය හා සැසඳීමේ දී, 2011 නොවැම්බර් මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 879 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය වූ අතර, ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,981 ක් දක්වා සියයට 78 කින් වර්ධනය විය. ආනයන ඉහළයාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ රජයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන භාණ්ඩ ආනයන ඉල්ලුම ඉහළයාම (මෙයින් සැලකිය යුතු කොටසක් විදේශීය ණය වශයෙන් රජයට දෙනු ලබන අරමුදල් විය) සහ පුද්ගලික අංශය විසින් ආනයනය කරනු ලබන අන්තර් සහ ආයෝජන භාණ්ඩ, ඉහළයාමයි.

2010 වසරේ අනුරූප මාසය සමග සැසඳීමේ දී 2011 නොවැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආන්තික ලෙස වර්ධනයක් වාර්තා කළ අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, දියමන්ති හා ස්වර්ණාභරණ, ආහාර, පාන හා දුම්කොළ සහ රෙදිපිළි හා ඇඟළුම් යන අංශයන්හි අඛණ්ඩ ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. කාර්මික අපනයන 2011 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 35 කින් ඉහළ ගිය අතර, 2010 වසරේ අනුරූප මාසය හා සැසඳීමේ දී 2011 නොවැම්බර් මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයනය සියයට 28.5 කින් ද, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අපනයනය සැලකිය යුතු ලෙස සියයට 97.3 කින් ද ඉහළ

ගියේය. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අපනයනය ශීඝ්‍ර ලෙස ඉහළයාමට සිංගප්පූරුවට සහ ටැන්සානියාවට කුඩා නැව් දෙකක් අපනයනය කිරීම හේතු විය. 2011 නොවැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන අතරින් තේ සහ පොල් මද නිෂ්පාදිත ඇතුළු පොල් අපනයනයෙන් ලද ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේදී පිළිවෙලින් සියයට 7.1 කින් සහ 46.9 කින් වර්ධනය විය. දේශීය කර්මාන්තවලින් රබර් සඳහා වූ ඉල්ලුම තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම නිසා අපනයන පරිමාවේ අඩුවීම හේතුවෙන් රබර් අපනයනයෙන් ලද ආදායම 2011 වසරේ නොවැම්බර් මාසයේ දී අඩු විය.




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2011 වසරේ නොවැම්බර් මාසයේ දී ආනයන වියදමට ප්‍රධාන වශයෙන් දායක වූයේ අන්තර් සහ ආයෝජන භාණ්ඩ ආනයන ඉහළ යාමයි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී අන්තර් භාණ්ඩ ආනයනය සියයට 81.1 කින් වර්ධනය වූ අතර මේ සඳහා ඛනිජ තෙල්, රෙදිපිළි හා ඇඟළුම් සහ පොහොර ආනයනය හේතු විය. 2010 වසරේ නොවැම්බර් මාසයේ දී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 84.85 ට සාපේක්ෂව 2011 නොවැම්බර් මාසයේ දී බොරතෙල් බැරලයක මිල එ.ජ.ඩොලර් 113 ක් වැනි ඉහළ අගයක පැවැතීම ඛනිජ තෙල් ආනයන වියදම වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පොහොර ආනයන මිල සහ පරිමාව පිළිවෙළින් සියයට 326 කින් සහ සියයට 99.9 කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ සියලුම වගාවන් ආවරණය වන පරිදි පොහොර සහනාධාරය ලබා දීම නිසා පොහොර ආනයන පරිමාව ශීඝ්‍ර ලෙස වැඩි වීමයි. 2011 නොවැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 91.9 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 48.2 කින් වැඩි විය.

2010 වසරේ පළමු මාස එකොළහ සමග සැසඳූ විට 2011 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සමුච්චිත අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 9,581 දක්වා සියයට 22.2 කින් වර්ධනය වූ අතර ආයෝජන භාණ්ඩ ආනයනයෙහි වූ සැලකිය යුතු වර්ධනය සහ ඛනිජ තෙල් ආනයන පරිමාවේ හා මිලෙහි වූ ඉහළ වර්ධනය හේතුවෙන් සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 18,417 ක් දක්වා සියයට 53.2 කින් වර්ධනය විය. මීට අමතරව, සමස්ත ආනයන වියදම වර්ධනය සඳහා රත්‍රන් සහ මෝටර් රථ ආනයන ද බොහෝදුරට දායක වී ඇත. 2010 වසරේ පළමු මාස එකොළහ සමග සැසඳීමේ දී 2011 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සඳහා රත්‍රං ආනයන එ.ජ.ඩොලර් මිලියන 553 දක්වා සය ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වූ අතර, මෝටර් රථ ආනයන එ.ජ.ඩොලර් මිලියන 913 ක් දක්වා දෙගුණයකින් පමණ ඉහළ ගොස්

ඇත. 2011 වසරේ පළමු මාස එකොළහ තුළදී වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 8,835 ක්ව පැවැතුණු අතර, මින් සැලකිය යුතු ප්‍රමාණයක් සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වූයේ විදේශීය ණය ආධාරයෙන් රජය විසින් සිදු කරනු ලබන යටිතල පහසුකම් ව්‍යාපෘතීන්ට අදාළ ආනයනයන් මගිනි. ඒ අනුව 2011 වසරේ පළමු මාස එකොළහ තුළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව ද ඇතුළත්ව රජයට මුළු විදේශ විනිමය ගලා ඒම එ.ජ.ඩොලර් මිලියන 4,027 ක් විය.

2010 වසර සමග සැසඳීමේ දී 2011 වසර තුළ සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 830 ක් දක්වා සියයට 44.2 ක යහපත් වර්ධනයක් පෙන්වීය. 2010 වසර සමග සැසඳීමේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 855,975 ක් දක්වා සියයට 30.8 කින් වර්ධනය විය. 2011 වසරේ පළමු මාස එකොළහ තුළදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 4,639 දක්වා සියයට 23.8 කින් වර්ධනය විය. සේවා අපනයන පුළුල් කිරීම සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීම, වෙළෙඳ හිඟයෙන් වන බලපෑම අවම කරගැනීම සඳහා ඉවහල් වූ අතර, එමගින් 2011 වසරේ පළමු මාස එකොළහ සඳහා ජංගම ගිණුමේ හිඟය ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 3,999 ක් දක්වා පහත වැටුණි. වාණිජ බැංකු විසින් එම බැංකුවල දෙවන පෙළ ප්‍රාග්ධනය ලෙසින් විදේශ අරමුදල් යොදා ගැනීමට පෙළඹීමත් සමග කෙටිකාලීන විදේශ මූල්‍ය ප්‍රවාහ රට තුළට ගලා ඒම් තවදුරටත් ශක්තිමත් වේ යැයි අපේක්ෂා කරන අතර, මේ වන විටත් බැංකු විසින් එ.ජ.ඩොලර් මිලියන 490 ක්, වසරක කාලසීමාවක් සඳහා වූ කෙටිකාලීන පහසුකම් සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. ඒ සමගම බැංකු කිහිපයක් මේ වන විටත් දෙවන පෙළ ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා සාකච්ඡා පවත්වා ඇති අතර, මේ අනුව, 2012 වසරේ දී එ.ජ. ඩොලර් බිලියනයක පමණ ප්‍රාග්ධනයක් ලබාගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇත.

2011 වසරේ නොවැම්බර් අවසන් වන විට ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) ශේෂයන් රහිතව දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,201 ක් විය. 2011 නොවැම්බර් අවසන් වන විට දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ද ඇතුළුව මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 7,541 ක් විය. ආනයනික මාස සැලකූ විට, 2011 වසරේ නොවැම්බර් මාසය අවසන් වන විට පැවැති දළ නිල සංචිත ප්‍රමාණය සහ මුළු විදේශ සංචිත ප්‍රමාණය පිළිවෙළින් මාස 3.8 ක් සහ මාස 4.6 ක් සඳහා ප්‍රමාණවත් වනු ඇත.

අදාළ කාලපරිච්ඡේදය සඳහා විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පැහැදිලි වේ.

## විදේශ අංශයෙහි ක්‍රියාකාරිත්වය


| | 2010 නොවැ. (අ) එ.ජ.ඩො. මිලියන | 2011 නොවැ. (ආ) එ.ජ.ඩො. මිලියන | නොවැ. වර්ධනය (සියයට) | 2010 ජන: සිට නොවැ. (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ජන: සිට නොවැ. (ආ) එ.ජ.ඩො. මිලියන | ජන: සිට නොවැ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **787.9** | **879.3** | **11.6** | **7,841.0** | **9,581.4** | **22.2** |
| කෘෂිකාර්මික | 182.4 | 184.3 | 1.1 | 1,956.5 | 2,148.0 | 9.8 |
| මෙයින්: තේ | 115.2 | 123.4 | 7.1 | 1,319.8 | 1,344.2 | 1.9 |
| කාර්මික | 507.2 | 684.5 | 35.0 | 5,607.8 | 7,313.4 | 30.4 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 270.4 | 347.6 | 28.5 | 3,065.2 | 3,817.7 | 24.6 |
| රබර් නිෂ්පාදිත | 51.1 | 75.8 | 48.3 | 504.1 | 804.3 | 59.6 |
| ආහාර පාන හා දුම්කොළ | 43.7 | 59.5 | 36.0 | 471.9 | 560.5 | 18.8 |
| ඛනිජ ද්‍රව්‍ය | 8.7 | 10.5 | 20.9 | 87.5 | 119.8 | 36.9 |
| **ආනයන** | **1,113.0** | **1,980.5** | **78.0** | **12,022.2** | **18,416.5** | **53.2** |
| පාරිභෝගික භාණ්ඩ | 236.9 | 366.0 | 54.5 | 2,571.6 | 3,798.8 | 47.7 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 110.4 | 178.5 | 61.7 | 1,482.0 | 1,929.8 | 30.2 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 126.5 | 187.5 | 48.2 | 1,089.6 | 1,869.1 | 71.5 |
| අන්තර් භාණ්ඩ | 606.6 | 1,098.5 | 81.1 | 6,696.3 | 10,288.4 | 53.6 |
| මෙයින්: ඛනිජ තෙල් | 215.5 | 468.8 | 117.5 | 2,694.9 | 4,151.3 | 54.0 |
| රෙදිපිළි හා ඇඟළුම් | 160.2 | 185.6 | 15.9 | 1,536.4 | 2,038.1 | 32.7 |
| ආයෝජන භාණ්ඩ | 264.9 | 508.3 | 91.9 | 2,585.2 | 4,227.1 | 63.5 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 123.2 | 255.4 | 107.3 | 1,062.3 | 1,880.7 | 77.1 |
| ප්‍රවාහන උපකරණ | 47.5 | 123.0 | 159.1 | 510.6 | 912.3 | 78.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 67.1 | 94.7 | 41.2 | 736.0 | 1,018.0 | 38.3 |
| **වෙළෙඳ ශේෂය** | **-325.1** | **-1,101.2** | **238.8** | **-4,181.2** | **-8,835.2** | **111.3** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **365.9** | **436.0** | **19.2** | **3,746.3** | **4,638.7** | **23.8** |
| **විදේශීය අංශයේ සෘජු ආයෝජන (FDI) ( ඇ)** | **-** | **-** | **-** | **309.7** | **679.3** | **119.3** |
| **සංචාරක ඉපැයීම් (ඈ)** | **74.5** | **94.6** | **27.0** | **575.9** | **830.3** | **44.2** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඉ)** | **195.1** | **241.8** | **23.9** | **3,458.0** | **4,027.2** | **16.5** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 2010 සහ 2011 පළමු මාස නමය සඳහා විදේශීය සෘජු ආයෝජන
(ඈ) 2010 සහ 2011 සඳහා සංචාරක ඉපැයීම්
(ඉ) 2010 සහ 2011 රාජ්‍ය අංශයේ ලැබීම් තුළ පිළිවෙළින් 2010 ඔක්තෝබර් සහ 2011 ජූලි මාසයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# 4. 2012 ජනවාරි මස උද්ධමනය පහළ වැටේ

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/07 = 100) මගින් මනිනු ලබන ලක්ෂ්‍යමය උද්ධමනය 2011 දෙසැම්බර් මස පැවති සියයට 4.9 හි සිට 2012 ජනවාරි මාසයේ දී සියයට 3.8 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටිණි.*




වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද 2011 දෙසැම්බර් මස පැවති සියයට 6.7 හි සිට 2012 ජනවාරි මාසයේ දී සියයට 6.5 දක්වා පහළ වැටිණි. මීට අමතරව, කො.පා.මි.දර්ශකයේ භාණ්ඩ පැසෙන් නැවුම් ආහාර, බලශක්ති, ප්‍රවාහන, සහල් සහ පොල් යන අයිතමයන් ඉවත් කිරීමෙන් පසු ගණනය කරනු ලබන මූලික උද්ධමනය වාර්ෂික සාමාන්‍ය පදනම මත සිව්වන වරටත් අඛණ්ඩව පහළ බසිමින් 2012 ජනවාරි මාසයේ දී සියයට 6.7 ක අගයක් වාර්තා කළ අතර, ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2012 ජනවාරි මාසයේ දී සියයට 4.7 හි නොවෙනස්ව පැවතුණි.

මේ අතර, මාසික දර්ශකයෙන් පෙන්නුම් කෙරෙන පරිදි 2012 ජනවාරි මාසයේ දී පොදු මිල මට්ටමෙහි පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.3 ක ඉහළයාමක් වාර්තා වූ අතර, දර්ශකය නිරපේක්ෂ වශයෙන් 2011 දෙසැම්බර් මස පැවති 154.4 හි සිට 2012 ජනවාරි මාසයේ දී 154.8 දක්වා වැඩි විය. දර්ශකයේ මාසික ඉහළ යාම කෙරෙහි ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් වැඩි වීම ප්‍රධාන වශයෙන් දායක වී ඇත. මේ අනුව, ප්‍රවාහන (සියයට 2.0); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.3); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 1.1); සෞඛ්‍ය (සියයට 0.5); රෙදිපිළි හා පාවහන් (සියයට 0.5); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.4); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.2); සහ අධ්‍යාපන (සියයට 0.1) යන උප කාණ්ඩවල මිල ගණන් පෙර මාසයට සාපේක්ෂව ඉහළ නැගුණු අතර, සන්නිවේදන උප කාණ්ඩයේ මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, 2011 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2012 ජනවාරි මාසයේ දී ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන්හි සියයට 0.3 ක පහළ යාමක් සිදු විය. ආහාර උප කාණ්ඩයෙහි ඇතුළත් සමහර එළවළු වර්ග, අර්තාපල්, ලොකු ළූණු, දෙහි, අමුමිරිස්, වියළි මිරිස් සහ සීනි ආදියෙහි මිල ගණන් සැපයුමෙහි සිදුවූ වර්ධනය හේතුවෙන් පහළ වැටිණි.

## 5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2010, 2011 සහ 2012

(2006/07= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 |
| ජනවාරි | 140.4 | 149.2 | 154.8 | 1.9 | 1.4 | 0.3 | 7.1 | 6.2 | 3.8 | 3.2 | 6.1 | 6.5 |
| පෙබරවාරි | 141.1 | 151.3 | | 0.5 | 1.4 | | 7.5 | 7.2 | | 3.3 | 6.1 | |
| මාර්තු | 139.8 | 150.6 | | -0.9 | -0.5 | | 7.2 | 7.7 | | 3.4 | 6.2 | |
| අප්‍රේල් | 138.4 | 150.6 | | -1.0 | 0.1 | | 6.8 | 8.9 | | 3.8 | 6.4 | |
| මැයි | 140.1 | 151.5 | | 1.2 | 0.6 | | 5.6 | 8.2 | | 3.9 | 6.6 | |
| ජුනි | 141.2 | 151.2 | | 0.8 | -0.2 | | 5.1 | 7.1 | | 4.3 | 6.7 | |
| ජූලි | 141.2 | 151.7 | | 0.0 | 0.4 | | 4.4 | 7.5 | | 4.6 | 7.0 | |
| අගෝස්තු | 141.4 | 151.3 | | 0.2 | -0.3 | | 5.0 | 7.0 | | 4.9 | 7.1 | |
| සැප්තැම්බර් | 142.6 | 151.7 | | 0.8 | 0.3 | | 5.7 | 6.4 | | 5.3 | 7.2 | |
| ඔක්තෝබර් | 144.1 | 151.5 | | 1.1 | -0.1 | | 6.5 | 5.1 | | 5.7 | 7.1 | |
| නොවැම්බර් | 145.7 | 152.6 | | 1.1 | 0.7 | | 6.9 | 4.7 | | 6.1 | 6.9 | |
| දෙසැම්බර් | 147.2 | 154.4 | | 1.1 | 1.2 | | 6.8 | 4.9 | | 6.2 | 6.7 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව